Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School



# පුනරීක්ෂණ - සාරාංශය, වාක්‍ය රචනය, ප්‍රායෝගික ලේඛන

- ඔබට රචනා ලිවීම සඳහා ලබා දුන් ආකෘතිය සිහිපත් කරන්න.
- නිවැරදි උක්ත ආඛ්‍යාත රීති පිළිපදින්න.
- දී ඇති මාතෘකා වලට අදාළව ඡේද වෙන් කිරීම කරන්න.
- විනාඩි 30ක් ඇතුළත රචනාව ලිවීමට වග බලා ගන්න.
- සාරාංශය ලිවීමට පෙර දී ඇති කොටස හොඳින් කියවන්න.
- අවශ්‍ය කරුණු යටින් ඉරි ඇඳගන්න.
- නිවැරදි වියරණ හා ලේඛන රීති අනුගමනය කරමින් සාරාංශය ලියන්න.

1. පහත දැක්වෙන එක් එක් කරුණු යටතේ ඔබ කැමති මාතෘකාවකට වචන 250ට නොවැඩි රචනාවක් ලියන්න. එයට සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ). ලෝකයේ බොහො රටවල් විවිධ අවස්ථා වලදී වසංගත තත්ත්වයන්ට මුහුණ පා ඇත. ශ්‍රී ලංකාවට ද එය පොදු වූවකි. අතීත ශ්‍රී ලාංකිකයා එම තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දුන්නේ නිරෝධායනය හා තහංචි පැනවීම තුළින් ය. බටහිර වෛද්‍ය ක්‍රමයෙන් මෙම වසංගත තත්ත්වයන්ට ඖෂධ සොයා ගැනීමට උත්සුක වන අතර, ඇතැම් රටවල් සිය දේශීය වෛද්‍ය ක්‍රම තුළින් ද ප්‍රතිකාර සෙවීමට වෙහෙස ගනිති. ශ්‍රී ලංකාවේ ද එවැනි ඖෂධ වර්ග සොයා ගැනීමට යම්තාක් උත්සාහ කළ හොත් එය දේශීය ආර්ථිකයට ද වාසි සහගත වනු ඇතැයි විශ්වාස කළ හැකිය.

(ආ).ජලය අගනා සම්පතකි. ජලය නොමැතිව ජීවිත පවත්නා ගැනීමට සිතීමටවත් නොහැකි ය. අපේ රටේ පවා බීමට ජලය නොමැතිව බොහෝ ජනයා පීඩා විඳිති. ජල මූලාශ්‍රයන් අපවිත්‍ර වීමට ඉඩ නොදී රැක ගැනීමට කවුරුත් එකා වන්ව කටයුතු කළ යුතු ය.

(ඉ). සෑම මනුෂ්‍යයෙකුම තම ජීවිතය ගොඩ නගා ගැනිමට බොහෝ වෙහෙසති. එහිදී තමා හමුවට එන බාධක අතිශයින්ම භයානක ය. එවන් අවස්ථාවන් වලදී කායික හා මානසික පසුබෑම බොහෝ මිනිසුන්ගේ ලක්ෂණයකි. "නෑ, බෑ" නොකියා නැගී සිටීමට උත්සාහ දැරීම තුළින් අර්ථවත් ජීවිතයක් උදා කර ගැනීමට හැකිවනු ඇත. කළ යුතු වන්නේ අභියෝගයන්ට මුහුණ දී හැරවුම් ලක්ෂයක් උදාකර ගැනීමය.

2. පහත දැක්වෙන ඡේදය වචන 55, 65ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඇති වචන ගණනද උත්තරය අවසානයේ ලියන්න.

සංස්කෘතිය යන පදය මානව විද්‍යාඥයන් විසින් ව්‍යවහාර කරනු ලබන්නේ යම් කිසි පුද්ගලයෙකු ඔහුගේ රටේ සමාජයෙන් ඇබ්බැහි කර ගන්නා ඇදහිලි, සිරිත් විරිත්, ශිල්ප කලා, සම්ප්‍රදාය, කර්මාන්ත යන ආදිය එක් කොට හඳුන්වනු පිණිස' ය. ඒ සියල්ල ඔහු ලබන්නේ අතීතයේ සිට එන දායාදයන් වශයෙනි. එයින් ඇතැම් ඇදහිලි සිරිත් ආදිය ඔහු ඉගෙන ගන්නේ තිනැතිනි. ඇතැම් දේ ඔහුට ඇබ්බැහි කරනු ලබන්නේ අන්‍යයන් විසින් ඉගැන්වීමෙනි. 'සංස්කෘතිය' යන නමින් හැඳින්වෙන සියලු දේ ඔහු ලබන්නේ ඔහුගේ සමාජයෙන් බව යට කියන ලද විවරණයෙන් පෙනේ. සමාජ යන්ත්‍රය පහළ වන්නේ ජන සමූහයක් නිසා ය. සංස්කෘතිය සභ්‍ය මනුෂ්‍යයන් පමණක් නොව දඩයමින් ජීවත් වන වැද්දන්ට වුවද හිමි වූවකි. ම්ලේච්ඡයන්ගේත්, ශිෂ්ට මනුෂ්‍යයන්ගේත් සංස්කෘතීන් වෙනස් වන්නේ සංකීර්ණ ලක්ෂණ විසිනි.

3. පහත දැක්වෙන කොටස කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරුලියන්න.

වාග් වේදීයෙකු ක්‍රියා කරනුයේ සමාජ විද්‍යාඥයා මෙනි. ක්ෂේත්‍ර පර්යේෂණ, පුස්තකාල පරිහරණය මෙන් ම රසායනාගාරය ද ඔහුගේ කාර්යයන් සඳහා යොදා ගත හැකිය. ඔහු පැරණි ලේඛන ද අධ්‍යනය කරන නමුත් ජීවමාන භාෂා අධ්‍යනය කේන්ද්‍ර වෙයි. වාග් විද්‍යාඥයා යන්නද භාෂා ගැන අවබෝධයක් පතන්නකු හෝ භාෂා බොහෝමයක් දරන්නකු හෝ භාෂා අධ්‍යන කුසලතාව වර්ධනය කරගෙන ඇත්තකු සේ විය හැකිය. භාෂා ඉගෙනීම භාෂා ගැන ඉගෙනිමට වඩා වෙනස් වෙයි. වෙනස වාහනයක් පැදවීමට ඉගෙනීම හා වාහනයක යාන්ත්‍රික ක්‍රියාවලිය ඉගෙනීම මෙන් පරස්පරය. වාග් විද්‍යාඥයකු වීමට භාෂා රාශියක් දැන සිටීම හෝ භාෂා භාවිතය පිළිබඳ අධිකාරයක් දරන්නකු වීම අවශ්‍ය නොවේ. වාග් විද්‍යාඥයා භාෂාව හා සම්බන්ධ සමාජ සංස්කෘතික ප්‍රපංචයන් අධ්‍යනය කරන්නෙකි. පිළිගත හැකි වාක්‍ය ස්වරූප හෙවත් වාගුක්තීන් වලට පාදක වන ව්‍යූහය සොයා බලන ඔහු එයට අදාළ නීති සලකා බලයි.

I. වාග් වේදීයා සමාජ විද්‍යාඥයා ක්‍රියාකාරීත්වයෙන් සමාන වන්නේ කවර හේතු නිසා ද?

..................................................................................................

..................................................................................................

II. වාග් වේදියා ප්‍රමුඛස්ථානය දෙන්නේ කවර ක්ෂේත්‍රයන් කෙරෙහි ද?

..................................................................................................

..................................................................................................

III. භාෂා ඉගෙනීම හා භාෂා ගැන ඉගෙනීම පැහැදිලි කරන නිදසුන සඳහන් කරන්න.

..................................................................................................

IV. වාග් විද්‍යාඥයාගේ අධ්‍යයනයට ලක්වන්නේ කුමක් ද?

..................................................................................................

V. පහත සඳහන් යෙදුම්වල අදහස පැහැදිලි කරන්න.

(අ). අධිකාරයන් - ..................................................................................

(ආ). අධ්‍යයනය - ..................................................................................